**සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය - 2017**

**------------------------------------------**

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනතේ 18 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මණ්ඩලය පිහිටුවීම

2016 පෙබරවාරි 02 දිනැති අංක 1952/ 22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2002 අංක 24 දරන සුහසාධක ප්‍රතිලාභ පනත, 2016 පෙබරවාරි 15 දින සිට බලාත්මක කර තිබුණි. ඒ අනුව, පනතේ 03 ඡේදය ප්‍රකාරව, පනතේ කාර්යය සඳහා, පනත පරිපාලන කිරීම සහ පනතින් මණ්ඩලය වෙත වෙන්කර දෙන්නා වූ හෝ පැවරෙන්නා වූ බලතල ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍ය ඉටු කිරීම භාර කෙරෙන සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මස ස්ථාපිත කර තිබුණි. තවද, පනතේ 4(අ) ප්‍රකාරව පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්වරයා පත්වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන තවත් සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වී ඇත.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

ප්‍රමිතිය ප්‍රකාරව, කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියළු ආදායම් හා වියදම් ඇතුළත් කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයක් පිළියෙළ කළයුතු වුවත්, මණ්ඩලය විසින් වියදම් පමණක් ඇතුළත් කර වියදම් ප්‍රකාශනයක් පිළියෙල කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

ප්‍රමිතියේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක් භාවිතා කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම් ක්ෂය කිරීම ආරම්භ කලයුතු වුවත් අමාත්‍යාංශය මගින් ලබාදී තිබූ පිරිවැය රු. 4,584,793 ක් වූ වත්කම් ක්ෂය කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ලබාගත් හා 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු. 4,584,793 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස දක්වා තිබුණද, එම වටිනාකම ප්‍රාග්ධන සංචිතයක් ලෙස වෙනම දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු හා ලැබිය යුතු මුළු මුදල වූ රු.3,253,743 ක් ආදායම් වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට, සාවද්‍ය ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍යකරණය යටතේ ඇතුළත් කර ප්‍රාග්ධන වියදමක් ලෙස දක්වා වත්කම් වලට එකතු කර තිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2017 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දැක්වෙන වගකීම් ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත ප්‍රකාරව ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීමට හැකිවන විනිවිද ස්වභාවයේ තේරීම් ක්‍රියාවලියක් ඇති කිරීම පිණිසද, එම ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුසාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබුණි. කෙසේ වුවද, ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2017 වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව එහි පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(අ) සුභසාධක ප්‍රතිලාභ පනතට අනුව ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ ක්‍රමය පරීක්ෂා කිරීම පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ඒ පිළිබඳව වාර්තාවක් සකස් කිරීම සිදුකළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් මෙම අවසන් සමීක්ෂණ වාර්තාව සකස්කර නොතිබුණි.

එසේ නමුත්, රට තුල ඇතිවූ පළාත් පාලන ඡන්ද වාතාවරණය අවසන්වන තෙක් සමීක්ෂණය කල් තැබීම නිසාත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සමීක්ෂණ නියැදි ලබාදීමේ ප්‍රමාදයත් හේතු කොට ගෙන, අවසාන සමීක්ෂණ වාර්තාව 2017 වසර තුල ලබා ගැනීම ප්‍රමාද වූ බව සභාපතිවරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.

(ආ) සුභසාධක ප්‍රතිලාභ පනත අනුව, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින් කළමනාකරණය කළයුතු සියලු සුභසාධක වැඩසටහන් සඳහා පූර්ණ ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා 2016 සැප්තැම්බර් 28 දින සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය,

සමාජ සවිබල ගැන්වීමේ සුභසාධක අමාත්‍යාංශය සමඟ එක්ව තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ ආයතනය (ICTA) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

කෙසේ වුවද, මණ්ඩලය මගින් කළමනාකරණ කල යුතු ඒකාබද්ධ සුභසාධක ප්‍රතිලාභ කළමනාකරණ පද්ධතිය (IWMS) තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ ආයතනය මගින් සකස් කර දීමට භාරගෙන, එම ආයතනය වෙනත් බාහිර ආයතන 02 කට භාර දී තිබුණු බවත්, මෙම ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කර 2018 මැයි මස වන විට මාස අටකින් සම්පූර්ණ කර මණ්ඩලයට භාර දිය යුතු වුවද මෙම කාලය, පිළිබඳව එළඹී තිබුණු ගිවිසුමට ඇතුළත් කර නොතිබූ බවත්, 2017 වසර තුලදී ඒකාබද්ධ සුභසාධක ප්‍රතිලාභ කළමනාකරණ පද්ධතිය (IWMS) සම්පූර්ණයෙන් නිම කර සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට භාර දීමට තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ ආයතනයට නොහැකි වූ බව සභාපතිවරයා විගණනයට දන්වා එවා තිබුණි.

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

**--------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 20,100,000 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. 2,600,000 ක් වශයෙන් මුළු එකතුව රු. 22,700,000 ක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මෙම ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් මු.රෙ. 66 යටතේ, පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් අවස්ථා 03 කදී එකතුව රු. 13,000,000 ක් අඩු කිරීමෙන් පසු පුනරාවර්තන වියදම් සඳහා රු. 3,241,645 ක් ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. 820,000 ක් ද, වශයෙන් එකතුව රු. 4,061,645 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් මණ්ඩලයේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය රු. 4,061,645 ක් හෙවත් සියයට 18 ක් පමණක් වී තිබුණි.

සුභසාධක මණ්ඩලයේ ප්‍රධාන කාර්ය වන ඒකාබද්ධ සුභසාධක කළමනාකරණ පද්ධතිය (IWMS) සකස් කිරීම ප්‍රමාදවීම මත කාර්ය මණ්ඩලය පූර්ණ වශයෙන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය පැන නොනැඟීම හා ආයතනය 2017 වර්ෂයේත් මුදල් අමාත්‍යාංශය තුලම පවත්වාගෙන යාම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් දැරීමට සිදු නොවීම අරමුදල් ඌන උපයෝජනයට ප්‍රධාන හේතුවක් වූ හෙයින් මණ්ඩලයේ ඌන උපයෝජනය වූ ප්‍රතිපාදන වලින් කොටසක් මුදල් අමාත්‍යාංශය වෙත මු.රෙ. 66 මගින් මාරුකර ගන්නා ලද බව මණ්ඩලයේ සභාපතිවරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි.